# පොළොව ඉර ගැන දැනගැනීම

වචන හා සංකේත අතර ඇති සම්බන්ධය තව දුරටත් සාකච්ඡා කළ යුතු ය. මෙය සන්නිවේදනය හා සම්බන්ධ ය. මෙහි දී අප සන්නිවේදනය යන්නෙන් අදහස් කරන්නේ මානව සන්නිවේදනය බව පැහැදිලි ය. එහෙත් සන්නිවේදනය යන්න එයට වඩා පළල් අර්ථයකින් ඉදිරි කාලයේ දී බටහිර විද්‍යාවේ දී යොදා ගැනෙන බවට ලකුණු දැනටමත් පහළ වී ඇත. එබැවින් ඒ ගැන ද යමක් කිව යුතු ය. විශේෂයෙන් ම භාෂාව පිළිබඳ අපේ ප්‍රවාදයක් ගොඩනගමින් සිටින අවස්ථාවක සන්නිවේදනය පිළිබඳ වඩා පළල් සංකල්පයක් නිර්මාණය කර ගැනීම වැදගත් වෙයි. මානවයන් පමණක් නොව අනෙක් ප්‍රාණීන් ද විවිධ ක්‍රම මගින් සන්නිවේදනය කර ගන්නා බව පැහැදිලි ය. සතුන් හා සතුන් අතර සන්නිවේදනය කෙරෙන ආකාරය ගැන හැඟීමක් කපුටන්ගේ කෑ ගැසීම් මගින් මෙන් ම බල්ලන්ගේ බිරීම් මගින් ද අපට ඇති කර ගත හැකි ය. අද බටහිර භෞතික විද්‍යාඥයන් සමහර දෙනෙක් ක්වොන්ටම් අංශු අතර ඇතිවන සන්නිවේදන ගැන කතා කරති. සන්නිවේදනය සිදු වන්නේ ක්වොන්ටම් අංශු අතර පමණක් නොවේ. සාමාන්‍ය ලෝකයේ හමුවන නිව්ටෝනීය හෙවත් මහේක්ෂ අංශු අතර ද සන්නිවේදන සිදු වෙයි.

ඉර හෙවත් සූර්යයා නම් වස්තුවක් තිබෙන බව පොළොව දැන ගන්නේ කෙසේ ද? මෙහි දී දැන ගැනීම යනුවෙන් අදහස් කෙරෙන්නේ සවිඥානික ව කෙරෙන දැන ගැනීමක් නොවේ. පොළොවට චිත්ත ඇති නොවේ. ඒ අර්ථයෙන් ගතහොත් ඉර නම් වස්තුවක් ඇති බව පොළොව නොදනියි. එහෙත් පොළොව ගමන් කරන්නේ ඉර නම් වස්තුව වටා ය. ඉර වටා පොළොව ඉලිප්සාකාර පථයක ගමන් කරන්නේ යැයි කියනු ලැබේ. ඉර නම් වස්තුවක් ඇති බව පොළොව දන්නේ යැයි කියන්නේ ඉරෙහි යම් වෙනසක් ඇති වුවහොත් එය පොළොවට දැනෙන බැවිනි. සූර්ය ලප ඇති වුවහොත් පොළොවේ යම් යම් වෙනස්කම් ඇති වන බව අපි දනිමු. ඒ වෙනස්කම් පොළොවේ ඇති වන්නේ එවැනි වෙනස්කම් පිළිබඳ ව යම් සන්නිවේදනයක් පොළොවට කෙරෙන බැවිනි. යම්කිසි අයුරකින් ඉර දැන් තිබෙන තැනින් වෙනත් ඈත තැනකට ගෙන ගියේ යැයි සිතමු. එසේත් නැත්නම් ඉරේ පරිමාව වැඩිවන්නට පටන් ගත්තේ යැයි සිතමු. මේ වෙනස් වීම් පොළොවට නොදැනෙන්නේ නොවේ. එහෙත් එය ක්ෂණික ව පොළොවට නොදැනෙයි. පොළොවට ඒ වෙනස දැනෙන්නේ, නැත්නම් ඒ වෙනස පෙළොවට සන්නිවේදනය වන්නේ වෙනස සිදු වීමෙන් විනාඩි අටකට පමණ කාලයෙන් පසුව ය. එයට හේතුව එවැනි වෙනස්කම් ඉරෙන් පොළොවට සන්නිවේදනය වීමට විනාඩි අටක පමණ කාලයක් ගතවන බැවිනි.

ඒ විනාඩි අට ගතවීමෙන් පසුව සමහර විට ඉරේ ඇති වූ වෙනස්කම් අනුව පොළොව වේගයෙන් සර්පිලාකාර පථයක සූර්යයා දෙසට ඇදී යෑමට ඉඩ ඇත. එසේත් නැත්නම් වෙනත් පථයක ගමන් කිරීම අරඹනු ඇත. එහෙත් වෙනස සිදු වී විනාඩි අටක් ගත වන තුරු පොළොවට ඒ කිසිවක් නොදැනෙයි. විනාඩි අට ගත වන තුරු පොළොව එතෙක් ගමන් කරමින් තිබූ කක්ෂයෙහි ම ගමන් කරනු ඇත. එසේ වීමට හේතුව නිව්ටෝනීය හෙවත් මහේක්ෂ අංශු සඳහා සන්නිවේදනය කළ හැකි උපරිම වේගයක් තිබීම ය. මේ උපරිම ප්‍රවේගය අන් කිසිවක් නොව, ආලෝකයේ ප්‍රවේගය වෙයි. වෙනසක් වී ඇති බව ඉරේ සිට පොළොවට ආලෝකයේ වේගයෙන් සන්නිවේදනය වීමට විනාඩි අටක් පමණ ගත වෙයි. දැනට බටහිර විද්‍යාඥයන් කියන ආකාරයට විද්‍යුත් චුම්බක වෙනස් වීම් සන්නිවේදනය කළ  හැක්කේ ආලෝකයේ වේගයෙනි. අයින්ස්ටයින් විද්වතා ඉදිරිපත් කළ  සාධාරණ සාපේක්ෂතාවාදය අනුව ඊනියා ගුරුත්වජ වෙනස් වීම් සන්නිවේදනය වන්නේ ද ආලෝකයේ ප්‍රවේගයෙනි. එබැවින් ඉරෙහි යම් ගුණයක වෙනස් වීම් පොළොවට දැනෙන්නට සැලැස්වීමට විනාඩි අටක පමණ කාලයක් ගත වෙයි.

මහේක්ෂ වස්තු අතර සන්නිවේදනය සඳහා එලෙස උපරිම වේගයක් තිබුණ ද ක්වොන්ටම් හෙවත් ක්ෂුද්‍ර අංශු සඳහා එවැනි උපරිම වේගයක් නැතැයි දැනට නිගමනය කිරීමට සිදු වී ඇත. ක්වොන්ටම් අංශු දෙකක් අතර සන්නිවේදනය ඒ ක්ෂණයෙහි ම සිදුවන බව පසුගිය අවුරුදු විස්සක පමණ කාලයක් තුළ කෙරී ඇති පරීක්ෂණවලින් හෙළිවන බව කිව හැකි ය. මෙයින් කියැවෙන්නේ ක්වොන්ටම් අංශුවක පැවැත්ම තවත් ක්වොන්ටම් අංශුවක් දැන ගැනීමට කාල ප්‍රාන්තරයක් ගත නොවන බව ය. මේ අදහස් තවමත් වර්ධනය වන තත්වයක ඇති බැවින් ස්ථාවර නිගමනවලට පැමිණීම අපහසු වෙයි. ක්වොන්ටම් අංශු සඳහා මහේක්ෂ අංශුවල දී ගැනෙන කාලය හා අවකාශය යන සංකල්ප අදාළ නොවන්නේ යැයි ද සිතිය හැකි ය. කෙසේ වෙතත් සමහරවිට මුළු මහත් බටහිර භෞතික විද්‍යාව ම

© Prof. Nalin De Silva

සන්නිවේදනය පිළිබඳ විද්‍යාවක් ලෙස සැලකෙන දිනයක් උදාවිය හැකි ය. සන්නිවේදනය කෙරෙන්නේ තොරතුරු බැවින් අනාගතයේ දී තොරතුරු යන්න දැන් තොරතුරු තාක්‍ෂණයෙහි (ඉන්ෆමේෂන් ටෙක්නොලොජි) යෙදෙන අර්ථයට වඩා පුළුල් අර්ථයකින් යොදා ගනු ඇතැයි සිතිය හැකි ය. මෙහි දී අප විසින් ගොඩ නගනු ලැබ ඇති මනස පිළිබඳ ප්‍රවාදය ද සිහියට එයි. සිංහල බෞද්ධ මනස මැයෙන් ඉරිදා දිවයින සංග්‍රහයෙහි පළවූ ලිපියක හා තවත් ලිපිවල ඒ පිළිබඳ විස්තර අඩංගු වෙයි. එහි මනස ගැන ප්‍රවාදය ගොඩ නැගෙන්නේ තොරතුරු යන්න ඇසුරෙනි.

දැන් අපි නැවතත් වචන හා භාෂාව ගැන සිත යොමු කරමු. මහේක්‍ෂ අංශු අතර සන්නිවේදනය බටහිර භෞතික විද්‍යාවෙහි විද්‍යුත් චුම්බක ආදී ක්‍ෂෙත්‍ර (ෆීල්ඩ්ස්) නමින් හැඳින්වෙන දෑ ඔස්සේ සිදු වන්නේ ය යන්න බටහිර විද්‍යාඥයන්ගේ මතය වෙයි. මානවයන් අතර සන්නිවේදනය වන්නේ වෙනත් ආකාරවලට ය. කලින් සඳහන් කර ඇති ආකාරයට සංගීතය, චිත්‍රය වැනි දෑ ද එහි දී උපයෝගී කර ගැනෙයි. ඒ අතර මුහුණේ ඉරියව් මගින් ද සන්නිවේදනය වෙයි. ශරීර භාෂාව (බොඩි ලැන්ග්වේජ්) යන්න අද බහුලව යොදා ගන්නා වචනයක් බවට පත් වී ඇත. මෙයින් කියැවෙන්නේ සිරුර ඒ ඒ අවස්ථාවේ ගන්නා හැඩරුව අනුව ඇතැම් තොරතුරු සන්නිවේදනය වන බව ය. මුහුණ එල්ලා ගෙන උරහිස් කඩා වැටී සිටින පුද්ගලයකු ප්‍රීතියෙන් සිටින්නේ යැයි අපි නොකියමු. මේ කරුණු වලින් පැහැදිලි විය යුත්තේ මානව සන්නිවේදනයේ වුව ද භාෂාව යනු යොදා ගනු ලැබෙන එක් මාතයක් හෙවත් මාධ්‍යයක් පමණක් බව ය.

භාෂාව නිර්මාණය වන්නට ඇත්තේ මිනිස් විකාශයෙහි එක් අවස්ථාවක දී යැයි අපි දැනට උපකල්පනය කරමු. මේ උපකල්පනය වැරදි විය හැකි බව ද මතක තබා ගත යුතු ය. ඇතැම් විට මිනිසාගේ පරිණාමයෙහි මින්සා, මිනිසා බවට පත්වූයේ ම භාෂාව නිසා විය හැකි ය. එය එසේ නම් මිනිසා ආරම්භයේ සිට ම භාෂාව තිබී ඇත. එසේත් නැතහොත් පරිණාමය පිළිබඳ දැනට බටහිර පිළිගැනීමට ලක් වී ඇති අදහස් මුළුමනින් ම වැරදි විය හැකි ය. අග්ගඤ්ඤ සූත්‍රයෙහි දැක්වෙන පරිණාමය බටහිර කියැවෙන පරිණාමයට වඩා වෙනස් එකක් බව අමතක නොකළ යුතු ය. ඒ කෙසේ වෙතත් මිනිස් විකාශයෙහි එක් අවස්ථාවක මිනිසා විසින් භාෂාව නිර්මාණය කෙරිණි යැයි දැනට උපකල්පනය කරමු.

අපට වචනයක් අවශ්‍ය වන්නේ යමක් තවත් අයකුට දැන්වීමට ය. නැතහොත් යමක් ගැන ගැඹුරින් හා වියුක්ත ව සිතීමට ය. තමාට යමක් පිළිබඳ මූලික අදහසක් ඇති කර ගැනීමට වචන අවශ්‍ය නොවේ. එකම වර්ගයක වුව ද (උදාහරණයකට අරලිය යැයි ගනිමු) රතු පාට මලක් හා කහ පාට මලක් දකින අපි ඒ දෙකෙහි වෙනස දැන ගනිමු. ඒ වෙනස දැන ගැනීම සඳහා රතු හා කහ යන වචන අවශ්‍ය නොවේ. පාට ගැන ඇති වචන නොව මල යන වචනය ද එහි දී අවශ්‍ය නොවේ. වචන නැතිව වුව ද අපට මල ගැන නැත්නම් කහ පාට මල ගැන විඥප්තියක් ඇති වෙයි. මේ විඥප්තිය චිත්ත රූපයක් මගින් සිදු වෙයි. ඉර හා පොළොව අතර හෝ මල හා මල අතර ඇති වන සන්නිවේදනවලට වඩා වෙනසක් මානව සන්නිවේදනයෙහි දී සිදු වන්නේ මනසේ ක්‍රියාකාරීත්වය හේතු කොටගෙන ය. අපි වෙනත් මිනිසුන් සමග සන්නිවේදනය කර ගැනීමට පළමු අප සමග ම සන්නිවේදනය කර ගන්නෙමු. මල ඇති බව මල දන්නේ දැයි අපි නොසිතමු. එහෙත් ඉර අව්ව වැටුණු කල මලට ඒ බව දැනෙන බව සන්නිවේදනය වන බව අපට කිව හැකි ය. මනස් ඇති සතුන් හා මනස් නැති ගල් වැනි ද්‍රව්‍ය හෝ ගස් වැනි ජීව හෝ අතර ඇති ප්‍රධාන ම වෙනස මනස් ඇති සතුන්ට, එනම් ප්‍රාණීන්ට, තමන් ගැන ඇති දැනීම හෙවත් විඥප්තිය විය හැකි ය.

අපි සියල්ලට ම පළමු ව අපි ගැන දැන ගන්නෙමු. ඒ සඳහා ඊනියා අනෙකෙක් අවශ්‍ය නැත. බටහිර පශ්චාත්නූතනවාදී අදහස්වලට අනුව අප, අප ගැන දැන ගන්නේ අනෙකාගේ මාර්ගයෙනි. මෙය බහුබූත අදහසක් පමණකි. අනෙක් අය අපේ ජීවිතවලට බලපෑම් කරන බව පැහැදිලි ය. එහෙත් අප, අප ගැන දැනගන්නේ අනෙක් අය නිසා නොවේ. අනෙක් අය ගැන අප දන්නේ නම් එ අප පළමුව අප ගැන දන්නා නිසා ය. අනෙකාට සාපේක්‍ෂව අප නිර්මාණය වීම බටහිර ද්විමය විරුද්ධයන් (බයිනරි ඔපසිෂන්ස්) ට සම්බන්ධ ය. බටහිර පශ්චාත්නූතනවාදීහු ද්විමය විරුද්ධයන් පිළිබඳ අදහස් පට්ටා ගසති. එහෙත් ඒ අතර ම ඒ අදහස් යොදා ගනිති! අනෙක් අතට බටහිර පශ්චාත්නූතනවාදී අදහස දෙවියන් වහන්සේගෙන් ගලා එන්නකි. බටහිර දේව නිර්මාණවාදී අදහස් අනුව අප, අප ගැන දන්නේ දෙවියන් වහන්සේ නිසා ය. මේ ඊනියා අනෙකා පිළිබඳ අදහසේ සම්භවය අපෙන් තොරව ඇති ලෝකයක හා දෙවියන් වහන්සේ තුළ අවසානයේ දී දැක ගත හැකි ය. මෙරට අනුකාරකයන්ට බටහිරින් එන ඕනෑම

© Prof. Nalin De Silva

දෙයක් අනුකරණය කිරීමට ඇති කැදරකම අනෙක් සියල්ලට ම වඩා ලොකු වන්නේ එමගින් ලොක්කන් හෙවත් පොරවල් වීමට හැකි යැයි මතයක් ඇති කර ඇති බැවිනි.

දැනුම පිළිබඳ දැනුමෙහි දී වඩා වැදගත් වන්නේ විඥ්ඥාණය මිස ඊනියා අනෙකා පිළිබඳ බහුබූත අදහස් නොවේ. මේ විඥ්ඥාණය ඇති වන ආකාරය බෞද්ධ ධර්මයෙහි විස්තර කෙරී ඇත. මලක් පිළිබඳ ව හෝ රතු පාට පිළිබඳ ව හෝ අපට විඥ්ඥාණයක් ඇති වෙයි. ඒ සඳහා වචන අවශ්‍ය නොවේ. එහි දී සිදු වන්නේ ඒ පිළිබඳ චිත්ත රූපයක් නිර්මාණය කර ගැනීම ය. චිත්ත රූපය යනු සංකල්පයකි. එනම් සංස්කාරකයකි. බෞද්ධ ධර්මයෙහි නාමරූප ගැන කියැවෙන තැන්හි නාම යන්න අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කාර නොවූ, එනම් එකක් අනෙක මත පරායත්ත වූ, කොටස් හතරක් ගැන සඳහන් වෙයි. එනම් වේදනා, සංඥා, සංස්කාර හා විඥ්ඥාණ ය. මේ එකක් හෝ අනෙක නැතිව නූපදියි. (මෙය බටහිර පශ්චාත්නූතනවාදයෙහි එන කසිකබල් අනෙකා යන සංකල්පය සමග පටලවා ගත යුතු නොවේ. අනෙකා යන්න ද්විමය විරුද්ධයකි.) මෙහි කොතැනකවත් වචන ගැන සඳහන් නොවෙයි. රතු පාට ගැන දැන ගැනීමේ දී, එනම් රතු පාට යන සංකල්පය නිර්මාණය කර ගැනීමේ දී රතු යන වචනය අවශ්‍ය නොවේ. භාෂාවක් නොදන්නා ළදරුවන්ට රතු පාට ගැන හැඟීමක් නොමැති යැයි කිව හැකි නොවේ. රතු යන්න පසු කලෙක භාෂාව නිර්මාණය කර ගැනීමෙන් පසුව මිනිසා විසින් මේ සෘජු සංජානනයට දී ඇති නමකි. සංජානනයක් සංකල්පයකින් තොරව ඇති නොවන බව ද මෙහි දී තේරුම් ගත යුතු ය. (වැඩි විස්තර සඳහා මගේ ලෝකය කියවන්න.)

**මහාචාර්ය නලින් ද සිල්වා**